## හෙළ හමුදාව

# රාජ ධර්මය

(2025 සැප්තැම්බර් මස 23 අඟහරුවාදා වන දින නිකුත් කළ පළමුවර රාජ ධර්මය)

(2025 ඔක්තෝම්බර් මස 02 දින මුද්‍රණ දෝෂ ඉවත් කර සංස්කරණය කරන ලදී.)

හෙළ හමුදාව ලේඛන අංශය විසින් ප්‍රකාශිතයි.

# පටුන

## පළමුවන පරිච්ඡේදය - හෙළ හමුදාව, අරමුණ, පාලන ක්‍රමය සහ පරමාධිපත්‍යය


1 හෙළ හමුදාව ........ 3
2 අරමුණ ........ 3
3 මෙහෙවර ........ 3
4 පාලන ක්‍රමය ........ 3
5 පරමාධිපත්‍යය ........ 3
6 පරමාධිපත්‍යය ක්‍රියාත්මක කිරීම ........ 3
7 හෙළ හමුදාවට අයත් භූමිය ........ 4
8 නිල ලාංඡනය ........ 4
9 නිල කොඩිය ........ 4
10 නිල දිනය ........ 4
11 නිල ගීය ........ 4


## දෙවන පරිච්ඡේදය - සිංහල ජාතිය සහ බුද්ධ ධර්මය


12 සිංහල ජාතිය ........ 4
13 බුද්ධ ධර්මය ........ 4


## තුන්වන පරිච්ඡේදය - මූලික නිදහස


14 මූලික නිදහස ........ 5
15 චින්තනයේ සහ හෘදසාක්ෂියේ නිදහස ........ 5
16 වදහිංසා වලින් නිදහස ........ 5
17 සාධාරණත්වයේ නිදහස ........ 5
18 විනය පරීක්ෂණවලට ගැනීමේ හැකියාව ........ 5
19 සාමාජිකයෙකුගේ නිදහස ........ 5
20 තොරතුරු දැනගැනීමේ නිදහස ........ 6
21 සාමාජික නිදහසේ සීමා ........ 6
22 මූලික නිදහස උල්ලංඝනයට ප්‍රතිකර්මය ........ 6


## හතරවන පරිච්ඡේදය - භාෂාව


23 හෙළ හමුදාවේ භාෂා ........ 7
24 කාර්යය කිරීමේ භාෂා ........ 7
25 ඉගැන්වීමේ භාෂා ........ 7
26 පරිපාලන භාෂා ........ 7
27 නීති පැනවීමේ භාෂා ........ 7
28 අධිකරණයේ භාෂා ........ 7

පස්වන පරිච්ඡේදය - සාමාජිකයින් සහ සෙසු සබඳතාවයන්

29 හෙළ හමුදාවේ සාමාජිකයින්........8
30 හෙළ හමුදාවේ විශේෂ සාමාජිකයින්........8
31 හෙළ හමුදාවේ සාමාන්‍ය සාමාජිකයින්........8
32 හෙළ හමුදාවේ පුහුණු සාමාජිකයින්........8
33 හෙළ හමුදාවේ අයදුම්කරුවන්........8
34 හෙළ හමුදාවේ අනුශාසකයින්, උපදේශකයින්, සම්පත්දායකයින්........8
35 හෙළ හමුදාව විසින් ආරක්ෂා කරනු ලබන සෙසු පුද්ගලයින්........9
36 සාමාජිකයින් බඳවාගැනීමේ ක්‍රියා පටිපාටිය........9
37 සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම........10
38 සාමාජිකත්වය අහෝසි වී යාම........10

සයවන පරිච්ඡේදය - හෙළ හමුදාවේ ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූලධර්ම සහ සාමාජිකයින්ගේ මූලික වගකීම

39 හෙළ හමුදාවේ ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූලධර්ම........11
40 හෙළ හමුදාවේ ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූලධර්ම විනිශ්චය කළ හැකි ආකාරය........12
41 සාමාජිකයින්ගේ මූලික වගකීම්........12
42 මූලික වගකීම් විනිශ්චය කළ හැකි ආකාරය........13

සත්වන පරිච්ඡේදය - ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණය

43 හෙළ හමුදාවේ ප්‍රධානියා........14
44 ප්‍රධානියාගේ අසුන හිස් වීම........14
45 රාජ සභාව........14
46 රාජ සභාවේ අසුන් හිස් වීම........15
47 රාජ සභාවේ කාර්යය පටිපාටිය සහ බලතල........15

අටවන පරිච්ඡේදය - උපලේඛනය

48 උපලේඛනයේ අන්තර්ගතය........16

# හෙළ හමුදාව රාජ ධර්මය

පළමුවන පරිච්ඡේදය - හෙළ හමුදාව, අරමුණ, පාලන ක්‍රමය සහ පරමාධිපත්‍යය

## හෙළ හමුදාව

1 හෙළ හමුදාව ආධ්‍යාත්මික පදනමක් සහිත ස්වාධීන සංවිධානයකි.

## අරමුණ

2 ධාර්මික යුගය බිහිකිරීමට අවශ්‍ය රාජ්‍යතාන්ත්‍රික, ආර්ථික, සංස්කෘතික සහ අධ්‍යාපනික වටපිටාව සකස් කිරීම හෙළ හමුදාවේ අරමුණ වන්නේ ය.

## මෙහෙවර

3 හෙළ හමුදාව සමඟ සම්බන්ධ වන පුද්ගලයින්ට මූලික ධර්මාවබෝධය ඇති කර, ධාර්මික ජීවන රටාවකට වර්තමාන පද්ධතිය නොගැළපෙන ආකාරයත්, ගැළපෙන ධාර්මික, ආධ්‍යාත්මික, සාමූහික, ස්වභාවික, සශ්‍රීක, නීරෝගී, ශක්තිමත් සහ විවේකී හෙළ ජීවන රටාවත් පෙන්වා දී දේශන, වැඩමුළු, සාමූහික ආර්ථික ක්‍රමවේද, ස්වයංපෝෂිත හෙළ ආධ්‍යාත්මික ගම්මාන නිර්මාණය කිරීම ආදී ක්‍රමෝපායන් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම මගින් එම ජීවන රටාව ප්‍රායෝගිකත්වයට ගෙන ඒම හරහා මුළු රටටම අවශ්‍ය ධාර්මික ජීවන දර්ශනය ලබාදීම හෙළ හමුදාවේ මෙහෙවර වන්නේ ය.

## පාලන ක්‍රමය

4 හෙළ හමුදාව තුළ ක්‍රියාත්මක වන පාලන ක්‍රමය රාජාණ්ඩු ක්‍රමය වන්නේ ය. 'රාජා භවතු ධම්මිකො' යන තේමාව යටතේ පාලනය සිදු වන්නේ ය.

## පරමාධිපත්‍යය

5 හෙළ හමුදාවේ පරමාධිපත්‍යය හෙළ හමුදාවේ නායකයා කෙරෙහි පිහිටා ඇත්තේ ය. හෙළ හමුදාවේ නායකයා 'ප්‍රධානියා' නම් වන අතර හෙළ හමුදාවේ ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ බල කේන්ද්‍රය ප්‍රධානියා කෙරෙහි පිහිටා ඇත්තේ ය. එය අත්හළ නොහැක්කේ ය. නමුත් ඕනෑ ම සාමාජිකයෙකුට හෙළ හමුදාවෙන් ඉල්ලා අස් වීම පමණක් ඕනෑ ම අවස්ථාවකදී තීරණය කළ හැක්කේ ය.

## පරමාධිපත්‍යය ක්‍රියාත්මක කිරීම

6 පරමාධිපත්‍යය ප්‍රධානියා විසින් ක්‍රියාත්මක කිරීම ද, හෙළ හමුදාවෙන් ඵල ප්‍රයෝජන ලබන්නන් එය මගින් ප්‍රයෝජන භුක්ති විඳීම ද මතු දැක්වෙන ආකාරයෙන් සිදු වන්නේ ය.

1. හෙළ හමුදාවේ ප්‍රධානියා සෑම විටම සියලු දෙනාගේ අරමුණ සහ විනය බලගැන්වීම උදෙසා සියලු දෙනාට විධිවිධාන සහ උපදෙස් ලබාදීම සිදු කරනු ලබන්නේ ය.

2. අරමුණ සහ විනය බලගැන්වී හෙළ හමුදාවේ ප්‍රධානියා සමඟ විශ්වසනීය බව ඇති වීමෙන් ප්‍රධානියා විසින් තෝරා පත්කරගනු ලබන නායකයින්ගෙන් සමන්විත 'රාජ සභාව' නම් වූ ව්‍යවස්ථාදායකය මඟින් සාකච්ඡා කර අවසානයේ දී ප්‍රධානියාගේ අනුමැතිය සහිතව හෙළ හමුදාවේ ව්‍යවස්ථාදායක බලය ක්‍රියාත්මක කරනු ලබන්නේ ය.

3. හෙළ හමුදාවේ සාමාජිකයින්ගේ, හෙළ හමුදාව තුළ ආරක්ෂාව ඇතුළත්ව විධායක බලය ප්‍රධානියා මූලික කොටගෙන රාජ සභාව හරහා ක්‍රියාත්මක වන්නේ ය. ප්‍රධානියා මූලික නායකයින්ගේ විධායක බලය ආඥා බලය මූලික කොටගෙන ක්‍රියාත්මක වන්නේ ය. වාචික, ලිඛිත, සංඥා ක්‍රමවලින් ආඥා කළ හැක්කේ ය. විධායක බලය පැවරෙන්නේ රාජ සභාව විසින් අනුමත නායකයින්ට සහ අනුමත ප්‍රමාණයන්ට පමණක් වන්නේ ය.

4. හෙළ හමුදාවේ අධිකරණ බලය රාජ සභාව විසින් සම්පාදනය කර අනුමත කරන ලද අධිකරණ ක්‍රමවේදය මගින් ක්‍රියාත්මක කරනු ලබන්නේ ය. අධිකරණ බලය පැවරෙන්නේ රාජ සභාව විසින් අනුමත නායකයින්ට සහ අනුමත ප්‍රමාණයන්ට පමණක් වන්නේ ය.

5. රාජ ධර්මය තුළ රාජ සභාව විසින් යම් කටයුත්තක් කරන බව ප්‍රකාශ කිරීමේදී රාජ සභාව විසින් අනුමත කරන ලද ක්‍රියා පටිපාටියක් තිබේ නම් එය ද අදහස් වන්නේ ය. රාජ ධර්මය තුළ රාජ සභාවේ අනුමැතිය සහිත ලෙස සඳහන් ඕනෑ ම අවස්ථාවක එයින් ප්‍රධානියාගේ අනුමැතිය සහිත වීම අදහස් වන්නේ ය.

6. රාජ සභාව විසින් අනුමත කරන ලද මූලික නිදහස සියලු සාමාජිකයින් විසින්, ගරු කළ යුත්තේ ය. ආරක්ෂා කළ යුත්තේ ය. ආධ්‍යාත්මිකව සහ බාහිරව වර්ධනය කළ යුත්තේ ය. තව ද, ඒ මූලික නිදහස මෙහි මින්මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට සහ ප්‍රමාණයට මිස සංක්ෂිප්ත කිරීම, සීමා කිරීම හෝ අහිමි කිරීම නොකළ යුත්තේ ය.

7. තව ද, මෙම සියලු ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ නීති ප්‍රධානියාට අවශ්‍ය අවස්ථාවක ප්‍රධානියාගේ අභිමතය පරිදි රාජ සභාවේ සාකච්ඡාවකින් තොරව සකස් කිරීම, වෙනස් කිරීම, ඉවත් කිරීම, ක්‍රියාත්මක කිරීම, අත්හිටුවීම සහ නව නීති සකස් කිරීම ද කළ හැක්කේ ය.

## හෙළ හමුදාවට අයත් භූමිය

7 හෙළ හමුදාවට අයත් භූමීන් සියල්ල සම්පූර්ණයෙන් ම ප්‍රධානියාගේ අයිතියේ පවතින්නේ ය. රාජ සභාවේ අනුමැතිය පරිදි පරිපාලන ප්‍රදේශ පැනවීම, භුක්තිය සඳහා බෙදා දීම, වෙනස් කිරීම, නැවත බෙදීම හෝ ඒකාබද්ධ කිරීම කළ හැක්කේ ය.

## නිල ලාංඡනය

8 හෙළ හමුදාවේ නිල ලාංඡනය, උපලේඛනයෙහි නිරූපිත රන් කාසිය වන්නේ ය.

## නිල කොඩිය

9 හෙළ හමුදාවේ නිල කොඩිය, උපලේඛනයෙහි නිරූපිත 'හෙළ හමුදා' කොඩිය වන්නේ ය.

## නිල දිනය

10 හෙළ හමුදාවේ නිල දිනය ඔක්තෝබර් 10 වන දින ය.

## නිල ගීය

11 හෙළ හමුදාවේ නිල ගීය 'හෙළ හමුදා' ගීය වන්නේ ය. නිල ගීයෙහි පද මාලාව සහ සංගීතය උපලේඛනයෙහි දැක්වෙන්නේ ය.

දෙවන පරිච්ඡේදය - සිංහල ජාතිය සහ බුද්ධ ධර්මය

## සිංහල ජාතිය

12 හෙළ හමුදාව සිංහල ජාතියට මූලිකත්වය පිරිනමන්නේ ය. හෙළ හමුදාව තුළ අන් කිසිඳු ජාතියකට එරෙහිව කිසිඳු ප්‍රතිපත්තියක් නොමැති නමුත් සිංහල සංස්කෘතික ආභාසය හෙළ හමුදාවේ අරමුණට විශේෂ වැදගත්කමක් ඇති බැවින් සිංහල ජාතියට මූලිකත්වය පිරිනමන්නේ ය.

## බුද්ධ ධර්මය

13 හෙළ හමුදාව බුද්ධ ධර්මයට මූලිකත්වය පිරිනමන්නේ ය. හෙළ හමුදාව තුළ අන් කිසිඳු ආගමකට එරෙහිව කිසිඳු ප්‍රතිපත්තියක් නොමැති නමුත් බෞද්ධ ආගමික ආභාසය හෙළ හමුදාවේ අරමුණට විශේෂ වැදගත්කමක් ඇති බැවින් බුද්ධ ධර්මයට මූලිකත්වය පිරිනමන්නේ ය.

## තුන්වන පරිච්ඡේදය - මූලික නිදහස

### මූලික නිදහස

14 රාජ සභාව විසින් සම්මත කරන ලද, කිසිදු හෙළ හමුදා සාමාජිකයෙකුගෙන් උල්ලංඝනය නොවිය යුතු තවත් හෙළ හමුදා සාමාජිකයෙකුගේ මූලික නිදහසට අදාළ කරුණු 'මූලික නිදහස' නම් වන්නේ ය.

### චින්තනයේ සහ හෘදසාක්ෂියේ නිදහස

15 සෑම සාමාජිකයෙකුට ම හෙළ හමුදාව තුළ ඉගැන්වෙන ඕනෑ ම දෙයක්, කාරණාවක්, න්‍යායක් පිළිබඳව විමර්ශනය කිරීමට, ප්‍රශ්න කිරීමට ඇතුළුව හෘද සාක්ෂියට එකගව ක්‍රියාත්මක වීමට උපරිම නිදහස ඇත්තේ ය.

### වදහිංසා වලින් නිදහස

16 කිසිම සාමාජිකයෙකු වදහිංසා වලට හෝ කෲර, අමානුෂික, අවමන් සහගත සැළකිල්ලකට භාජනය නොකළ යුත්තේ ය.

### සාධාරණත්වයේ නිදහස

17

1. නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද, නීතියේ රැකවරණය ද සාධාරණ සහ හෙළ හමුදාවේ අරමුණට අනුකූල විය යුත්තේ ය.

2. කිසිම සාමාජිකයෙකු කුලය, ස්ත්‍රී පුරුෂ භාවය, රූප ස්වභාවය, ධනවත් බව ආදිය මත හෝ වෙනත් ඕනෑ ම කාරණාවක් හේතුවෙන් හිංසාවට සහ අසාධාරණයට භාජනය නොවිය යුත්තේ ය.

3. එසේ වුව ද රාජ සභාව විසින් විවිධ අංශ වල යම් සේවයක හෝ ධූරයක කාර්යය ඉටු කිරීම සඳහා විනය, ගතිගුණ සහ දක්ෂතා අනුව ශ්‍රේණිගත කිරීම් කළ හැක්කේ ය. එසේ ම තවදුරටත් යම් ධූරයකට හෝ කාර්යයකට අවශ්‍ය සුදුසුකම් අඩු නම්, ධූරයෙන් ඉවත් කිරීම හෝ එම අඩුපාඩු සකස් කරගැනීමට නියම කිරීමට රාජ සභාවෙන් අනුමත කළ නායකයින්ට ඇති හැකියාව හිංසනයක් නොවන අතර එය සාධාරණ ය.

### විනය පරීක්ෂණවලට ගැනීමේ හැකියාව

18

1. හෙළ හමුදාවේ නීති රීති සහ ප්‍රතිපත්ති වලට පටහැනිව යම් සාමාජිකයෙක් ක්‍රියාත්මක වන බවට රාජ සභාවට පැමිණිලි කිරීමකින් හෝ රාජ සභාවෙන් නිරීක්ෂණය කිරීමෙන් පසු රාජ සභාවෙන් අනුමත ක්‍රියාපටිපාටියට අනුව අදාළ පුද්ගලයින් විනය පරීක්ෂණ වලට ගැනීමට හැක්කේ ය.
2. රාජ සභාව විසින් අනුමත කරනු ලැබූ නායකයින් හැර කිසිම කෙනෙකුට කිසිම සාමාජිකයෙකු විනය පරීක්ෂණයකට ගැනීම නොකළ හැක්කේ ය.

### සාමාජිකයෙකුගේ නිදහස

19 සෑම සාමාජිකයෙකුටම හෙළ හමුදාවේ ප්‍රතිපත්ති සහ විනය නීති රාමුව තුළ,

1. ඕනෑම අදහසක්, ඕනෑම යෝජනාවක් නායකත්වයන් වලට ගෞරවාන්විතව ඉදිරිපත් කිරීමේ නිදහසට;
2. ඕනෑම දෙයක් සමාජය තුළ පළ කිරීමේ හෝ ප්‍රකාශ කිරීමේ නිදහසට;
3. ඕනෑම වෘත්තීයක, කර්මාන්තයක, ව්‍යවසායක නිරත වීමේ නිදහසට;
4. ඕනෑම අවස්ථාවකදී ඉල්ලා අස් වීමේ නිදහසට;
5. ඕනෑම වෙනත් සංවිධානයක සාමාජිකයෙකු වීමේ නිදහසට;
6. ඕනෑම අන්තර්පුද්ගල සම්බන්ධතාවයක් පැවැත්වීමේ නිදහසට;
7. ඕනෑම කටයුත්තක් සිදු කිරීමේ නිදහසට;
අයිතිය ඇත්තේ ය.

(හෙළ හමුදාවේ සාමාජිකයින්ගේ විශේෂ විනය නීති රාමුව උපලේඛනය තුළ සඳහන් වේ.)

## තොරතුරු දැනගැනීමේ නිදහස

20 හෙළ හමුදාවේ ආරක්ෂාව සහ සාමාජිකයින්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම උදෙසා හෙළ හමුදාව තුළ එක් රැස් කරන තොරතුරු ආරක්ෂිතව තැන්පත් කරන බැවින් හෙළ හමුදාවේ තොරතුරු වලට සාමාජිකයෙකුට ළඟා වීමට අවශ්‍ය වුවහොත් එම තොරතුරු අවස්ථානෝචිතව රාජ සභාවේ අනුමැතිය පරිදි පමණක් නිකුත් කරනු ලබන්නේ ය.

## සාමාජික නිදහසේ සීමා

21 ඉහත රාජ ධර්මවල ප්‍රකාශකොට පනවා ඇති රාජ සභාව විසින් නියම කරනු ලබන මූලික නිදහස භුක්ති විඳිය හැක්කේ, හෙළ හමුදාවේ අරමුණ, ආරක්ෂාව සහ ගුණාත්මක බාවය තහවුරු කිරීම පිණිස රාජ සභාව විසින් නියම කරනු ලබන නීති රාමුවට යටත්ව ය.

## මූලික නිදහස උල්ලංඝනයට ප්‍රතිකර්මය

22

1. මෙම පරිච්ඡේදයේ විධිවිධාන යටතේ යම් සාමාජිකයෙකුට හිමිවන මූලික නිදහස හෙළ හමුදාවේ යම් ඕනෑ ම විධායක හෝ පරිපාලනමය ක්‍රියාවක් මගින් හෝ කිසියම් සාමාජිකයෙකු මගින් හෝ උල්ලංඝනය කර හෝ උල්ලංඝනයට අත්‍යාසන්නව තිබීම හෝ සම්බන්ධයෙන් රාජ සභාවට විනය පරීක්ෂණයක් සඳහා පැමිණිලි කිරීමට, එම උල්ලංඝනය නිසා පීඩා විඳින හෝ එම උල්ලංඝනය දකින්නා වූ හෝ හෙළ හමුදාවේ සාමාජිකයින්ට හෝ වෙනත් බාහිර පුද්ගලයෙක්ට හෝ සම්පූර්ණ නිදහස ඇත්තේ ය.

2. ඒ සඳහා රාජ සභාවෙන් අනුමත කරන ලද පැමිණිලි කිරීමේ ක්‍රියාපටිපාටිය අනුගමනය කළ යුත්තේ ය.

3. තමන් අසාධාරණයට ලක්වීම හෝ අසාධාරණයක් නිරීක්ෂණය කිරීම හෝ පැමිණිලි කිරීමේ ක්‍රියාපටිපාටිය අනුව දැනුවත් නොකර සිටීම හෙළ හමුදාවේ සාමාජිකයෙකුගේ වරදක් වන්නේ ය.

4. හෙළ හමුදාවේ නීති රීති උල්ලංඝනය වී හෝ උල්ලංඝනයට අත්‍යාසන්නව තිබෙන අවස්ථාවකදී හෙළ හමුදාවේ අධිකරණ ක්‍රමයෙන් පැණවෙන දඬුවම් අසාධාරණ බව යම් සාමාජිකයෙකුට සිතෙන්නේ නම් රාජ සභාවට ඒ පිළිබඳව දැනුවත් කිරීම හෝ ඉල්ලා අස් වීම හෝ සිදු කළ හැක්කේ ය.

### හෙළ හමුදාවේ භාෂා

23 හෙළ හමුදාවේ ප්‍රධාන භාෂාව සිංහල භාෂාව වන්නේ ය. අතිරේක භාෂා පාලි සහ ඉංග්‍රීසි භාෂා වන්නේ ය.

### කාර්යය කිරීමේ භාෂා

24 නායකයින්ට සහ අනෙකුත් සාමාජිකයින්ට තමාගේ කාර්යය සහ කර්තව්‍යය ඉටු කිරීමට ප්‍රධාන වශයෙන් සිංහල භාෂාව සහ අත්‍යාවශ්‍ය ම තැන් වලදී ඉංග්‍රීසි භාෂාව භාවිත කළ යුත්තේ ය.

### ඉගැන්වීමේ භාෂා

25 හෙළ හමුදාවේ ඉගැන්වීම් භාෂාව ප්‍රධාන වශයෙන් සිංහල භාෂාව වන්නේ ය. එසේ වවු ද ඇතැම් අවස්ථා වලදී ඉංග්‍රීසි සහ පාලි භාෂා මෙන් ම අනෙකුත් ඕනෑ ම භාෂාවක් භාවිත කළ හැක්කේ ය.

### පරිපාලන භාෂා

26

1. සිංහල භාෂාව පරිපාලන භාෂාව විය යුත්තේ ය. හෙළ හමුදාවේ අංශ විසින් වාර්තා තබාගැනීම සඳහා සහ සියලු කටයුතු ඉටු කිරීම සඳහා සිංහල භාෂාව භාවිත කළ යුත්තේ ය.

2. සාමාජිකත්වයට ඇතුළත් කරගැනීම සඳහා සිංහල භාෂාවෙන් සන්නිවේදනය කිරීමේ ඉහළ හැකියාවක් පැවතිය යුත්තේ ය.

### නීති පැනවීමේ භාෂා

27 සියලු ම ආඥා, නීති, රීති සකස් කිරීම, පැනවීම, පළකිරීම සිංහල භාෂාවෙන් විය යුත්තේ ය.

### අධිකරණයේ භාෂා

28 හෙළ හමුදාව තුළ අධිකරණ කටයුතුවල භාෂාව සිංහල භාෂාව විය යුත්තේ ය.

පස්වන පරිච්ඡේදය - සාමාජිකයින් සහ සෙසු සබඳතාවයන්

## හෙළ හමුදාවේ සාමාජිකයින්

29 හෙළ හමුදාවේ සාමාජිකයින් ආකාර තුනක් වන්නේ ය. එනම් විශේෂ සාමාජිකයින්, සාමාන්‍ය සාමාජිකයින් සහ පුහුණු සාමාජිකයින් වන්නේ ය.

## හෙළ හමුදාවේ විශේෂ සාමාජිකයින්

30 හෙළ හමුදාවේ අරමුණට ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කිරීම සඳහා පිරිසිදු අරමුණෙන් සහ සටන් පුහුණුව ඇතුළු බොහෝ ක්ෂේත්‍රයන් පිළිබඳ මනා දක්ෂතාවයෙන් යුක්තව, හෙළ හමුදාවේ ප්‍රධානියාගේ විශ්වාසය දිනාගෙන, පූජනීය බෞද්ධ සිද්ධස්ථානයක ප්‍රධානියා ඉදිරියේ දිවුරුම් දී දැඩි අරමුණත්, ඉහළ විනයත් සහිතව පරාර්ථය වෙනුවෙන් කැප වී ජීවත් වෙන, හෙළ හමුදාවේ අභිමානය ප්‍රබලව වර්ධනය කරමින් ආරක්ෂා කරන, හෙළ හමුදාව ධෛර්යමත් කරන, හෙළ හමුදාවටත්, මුළු සමාජයටමත් ආදර්ශයක් වන්නා වූ හෙළ හමුදාවේ සාමාන්‍ය සාමාජිකයින් අතරින් තෝරාපත් කරගන්නා අභිමානවත් සාමාජිකයින් හෙළ හමුදාවේ විශේෂ සාමාජිකයින් වන්නේ ය.

## හෙළ හමුදාවේ සාමාන්‍ය සාමාජිකයින්

31 හෙළ හමුදාවේ පුහුණු සාමාජිකයින් අතරින් හෙළ හමුදාවේ අරමුණ සහ විනය ඉහළ මට්ටමකට සකස් කරගත්, හෙළ හමුදාවේ විෂය නිර්දේශය පිළිබඳව බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව පරීක්ෂා කොට තහවුරු කරගෙන, හෙළ හමුදාවේ අරමුණ වෙනුවෙන් ක්‍රියාත්මක වීමට රාජ සභාව විසින් සාමාන්‍ය සාමාජිකයින් ලෙස තෝරා පත්කර ගන්නා සියලු දෙනා හෙළ හමුදාවේ සාමාන්‍ය සාමාජිකයින් වන්නේ ය.

## හෙළ හමුදාවේ පුහුණු සාමාජිකයින්

32 හෙළ හමුදාවේ සාමාජිකත්වය අපේක්ෂාවෙන් හෙළ හමුදාව තුළ කටයුතු කරගෙන යන හෙළ හමුදාවේ අරමුණ සහ විනය පුහුණුව ලබමින් යන රාජ සභාව විසින් හෙළ හමුදාවේ අයදුම්කරුවන් අතරින් පුහුණු සාමාජිකයින් ලෙස තෝරා පත්කර ගන්නා ලද සියලු දෙනා හෙළ හමුදාවේ පුහුණු සාමාජිකයින් වන්නේ ය.

## හෙළ හමුදාවේ අයදුම්කරුවන්

33

1. හෙළ හමුදාවට සම්බන්ධ වීමේ අපේක්ෂාවෙන් බඳවාගැනීමේ ක්‍රියා පටිපාටියට සම්බන්ධ වන අපේක්ෂකයා හෙළ හමුදාවේ අයදුම්කරුවා වන්නේ ය.

2. හෙළ හමුදාවට ඇතුළත් කරගන්නේ සටන් පුහුණුව, ගොවිතැන් පුහුණුව ආදී ප්‍රායෝගික ක්‍රියාකාරකම් කළ හැකි මට්ටමේ කායික සහ මානසික යෝග්‍යතාවයෙන් යුක්ත වූවන් පමණක් වන්නේ ය.

3. එසේම හෙළ හමුදාවට ඇතුළත් කරගන්නේ තමන්ගේ මව්පියන් දෙපළත් ඔවුන්ගේ මව්පියන් සිව් දෙනාත් සිංහල ජාතිකයින් නම් සහ තමන් වර්තමානයේදී බෞද්ධ ආගමිකයෙක් වන අතර ම සැළකිය යුතු කාලයක් සිංහල බෞද්ධ සංස්කෘතියේ හැදී වැඩී ඇත්තෙක් නම් පමණක් වන්නේ ය.

## හෙළ හමුදාවේ අනුශාසකයින්, උපදේශකයින්, සම්පත්දායකයින්

34

1. හෙළ හමුදාවට සාමාජිකයෙක් ලෙස සම්බන්ධ වීමට අපේක්ෂාවක් නොමැති හෝ යෝග්‍යතාව නොමැති නමුත් හෙළ හමුදාවේ අරමුණට අනුශාසනා, උපදෙස්, සම්පත් මගින් හෝ වෙනයම් ආකාරයකින් දායකත්වය දැක්වීමට බලාපොරොත්තු වන්නා වූ පුද්ගලයින් අදාළ දායකත්වය අනුව හෙළ හමුදාවේ අනුශාසකයින්, උපදේශකයින් හෝ සම්පත්දායකයින් වන්නේ ය.

2. මොවුන්ට සාමාජිකයින්ගේ විශේෂ නීති රීති මාලාව අදාළ නොවන අතර ම රාජ සභාව විසින් විශ්වාසවන්තයින් ලෙස තහවුරු කර ගත් පුද්ගලයින් හැර අනෙකුත් පුද්ගලයින්ට, හෙළ හමුදාවේ සාමාජිකයින්ට ලැබෙන විශේෂ පුහුණුව සහ වරප්‍රසාද ද නොලැබීමට ඉඩ ඇත්තේ ය.

3. ආත්මාර්ථකාමී ව්‍යාජ අරමුණු සහිතව හෙළ හමුදාවට සහයෝගය දැක්වීමට උත්සහ කරන බව රාජ සභාව විසින් තීරණය කරන පුද්ගලයින් හෙළ හමුදාවට සම්බන්ධ කර නොගන්නේ ය.

## හෙළ හමුදාව විසින් ආරක්ෂා කරනු ලබන සෙසු පුද්ගලයින්

35

1. මින් ඉහත සඳහන් 'සාමාජිකයින් සහ සෙසු සබඳතාවයන්' පරිච්ඡේදය තුළ කිසිඳු කාණ්ඩයකට අයත් නොවන නමුත් හෙළ හමුදාව විසින් ආරක්ෂා කරනු ලබන සෙසු පුද්ගලයින් මෙම කාණ්ඩයට අයත් වන්නේ ය.

2. සාමාජිකයින්ගේ නෑදෑ හිතමිත්‍රාදීන්, ඉහළ ආධ්‍යාත්මික ගුණ සහිත පුද්ගලයින් වැනි රාජ සභාව විසින් අනුමත කරන ලද පුද්ගලයින් මීට ඇතුළත් වන්නේ ය.

## සාමාජිකයින් බඳවාගැනීමේ ක්‍රියා පටිපාටිය

36

1. හෙළ හමුදාවේ සාමාජිකත්වය ලැබීම රාජ සභාව විසින් සම්මත කරන ලද එවකට ක්‍රියාත්මක වන බඳවාගැනීමේ ක්‍රියා පටිපාටියට අනුකූලව සිදු කරනු ලබන්නේ ය.

2. මූලික බඳවාගැනීමේ කටයුතු හෙළ හමුදාව බඳවාගැනීමේ අංශය මගින් සිදු කරනු ලබන්නේ ය. එම බඳවාගැනීමේ කටයුතු වලට මූලිකත්වය දෙන අංශ ප්‍රධානියා 'බඳවාගැනීමේ අංශ ප්‍රධානී' නම් වන්නේ ය.

3. යම්කිසි ක්‍රමයකට යම්කිසි පුද්ගලයකුට හෙළ හමුදාවේ සාමාජිකයෙකු වීමට අවශ්‍ය වුවහොත් එම අයදුම්කරුව මූලික අයදුම් පත්‍රය සඳහා යොමු කරනු ලබන්නේ ය.

4. අයදුම්කරුවන් අතරින් මූලික සුදුසුකම් සහිත පුද්ගලයින් මූලික ආධ්‍යාත්මික සහ බාහිර අධ්‍යාපනය යටතේ ධර්මාවබෝධය, රාජ ධර්මය, විනය නීතිරීති, ආදිය පිළිබඳ මූලික හැඳින්වීමක් ලබා දී ඇතිවන විශ්වාසය අනුව පුහුණු සාමාජිකයෙකු ලෙස සම්බන්ධ කරගනු ලබන්නේ ය.

5. පුහුණු සාමාජිකයින් ලෙස සම්බන්ධ කරගැනීමේදී ඔවුන්ගේ කැමැත්ත සහ දක්ෂතාවය අනුව හෝ රාජ සභාවෙන් නියම කළ පරිදි හෝ යම් අංශයක කාර්යභාරයක් ලබා දෙනු ලබන්නේ ය.

6. ඒ අතරතුර පුහුණු කරවීම සහ පරීක්ෂා කිරීම සිදු කරනු ලබන අතර විෂය නිර්දේශයට සහ විනයට අදාළ පරීක්ෂණ වලින් සමත්ව විශ්වාසය තහවුරු වන තුරු පුහුණු සමාජිකයෙකු ලෙස ක්‍රියාත්මක කරවන්නේ ය.

7. පුහුණු සමාජිකයෙකු ලෙස පරීක්ෂා වලින් සමත්ව ඉතා පිරිසිදු අරමුණෙන් සහ විනයෙන් යුතුව හෙළ හමුදාවේ අභිමානය ආරක්ෂා කරමින්, වර්ධනය කරමින්, අනෙකුත් අය ධෛර්යමත් වන පරිදි උනන්දුවෙන් ක්‍රියාත්මක වන ආකාරය අනුව සාමාජිකත්වය දිවුරුම් දීම සඳහා රාජ සභාව විසින් තෝරාගනු ලබන්නේ ය.

8. තෝරාගත් පුද්ගලයින්ගෙන් හෙළ හමුදාවේ සාමාජික දත්ත පත්‍රිකාව පුරවාගෙන ඊට අදාළ ලියකියවිලි හෝ සාක්ෂි ද, හෙළ හමුදාවේ රාජ ධර්මයේ සහ හෙළ හමුදාවේ සාමාජිකයින්ගේ විශේෂ නීති රීති මාලාවේ පිටපත් ද අමුණා ඇති දිවුරුම් ප්‍රකාශයට අත්සන් කොට සාමාජිකත්වය ලබා දෙනු ලබන්නේ ය.

9. සාමාජිකයෙකුගේ යහපත් බව අවංක බව බුද්ධිමත් බව ආදී ගුණාංග අනුව හෙළ හමුදාවේ විශේෂ සාමාජිකයෙක් මෙන් ම රාජ සභාවේ සාමාජිකයෙක් දක්වා උසස්වීම් වලට පත් වී හෙළ හමුදාවට සේවය කළ හැක්කේ ය.

10. මෙම ක්‍රියාපටිපාටියට අමතරව යම් අවස්ථානෝචිත ක්‍රමවේදයක් භාවිත කිරීමට සිදුවුවහොත් රාජ සභාවේ අනුමැතිය පරිදි බඳවාගැනීම සිදු කළ හැක්කේ ය.

## සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම

37

1. ඕනෑම හේතුවක් මත හෙළ හමුදාවෙන් ඉවත් වීමට යම්කිසි සාමාජිකයෙකුට අවශ්‍ය වන්නේ නම් ඔහුට සදාචාරාත්මක ආකාරයට හේතු සඳහන් කර ඉල්ලා අස්වීම ලිඛිතව රාජ සභාව වෙත ඉදිරිපත් කළ හැක්කේ ය.

2. එවිට රාජ සභාවේ ක්‍රියා පටිපාටියට අනුව ඉල්ලා අස්වීමට අදාළ සාමාජිකයාගේ අයදුම්පත්‍රයේ ඉල්ලා අස්වීම, අදාළ හේතුවද සමග සඳහන් කොට, හෙළ හමුදාවේ වත්කම් අදාළ පුද්ගලයා ළඟ තිබේ නම් නැවත පවරාගෙන, රාජ සභාව විසින් අදාළ පුද්ගලයාට ඉවත්ව යාමට අවසර දෙනු ලබන්නේ ය.

## සාමාජිකත්වය අහෝසි වී යාම

38

1. සාමාජිකයෙකු හෙළ හමුදාවේ කටයුතු වලට සම්බන්ධ වීමකින් තොරව සහ හෙළ හමුදාව සමග සන්නිවේදනයකින් තොරව මාසයක් කල් ගත වීමෙන් අනතුරුව සාමාජිකත්වය අහෝසි වී යන්නේ ය.

2. හෙළ හමුදාවේ නීතිරීති වලට පටහැනිව, හෙළ හමුදාවේ අභිමානය කෙලෙසමින්, හෙළ හමුදාවට ද්‍රෝහීව කටයුතු කළ බවට රාජ සභාව විසින් තීරණය කිරීමෙන් සාමාජිකත්වය අහෝසි වී යාම දක්වා දඬුවම් ලැබිය හැක්කේ ය.

3. ඉහත 'සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම' රාජ ධර්මයේ සඳහන් නිවැරදි ඉල්ලා අස්වීමේ ක්‍රියා පටිපාටියෙන් පරිබාහිර ක්‍රමයකට හෙළ හමුදාවෙන් ඉවත් වී ගියහොත් හෝ ඉවත් කළහොත් එම පුද්ගලයාගේ නම හෙළ හමුදාවේ රතු දත්ත වාර්තාවට ඇතුළත් වන්නේ ය.

4. එසේ අහෝසි වී යාමක් සිදු වූ විට නැවත හෙළ හමුදාවට පැමිණීමට අවශ්‍ය වුවහොත් ප්‍රතික්ෂේප කිරීම හෝ නැවත බරපතළ කොන්දේසි සහිතව බඳවාගැනීමේ වැඩපිළිවෙළ යටතේ සිදු වන්නේ ය.

සයවන පරිච්ඡේදය - හෙළ හමුදාවේ ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූලධර්ම සහ සාමාජිකයින්ගේ මූලික වගකීම

## හෙළ හමුදාවේ ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූලධර්ම

39

1. හෙළ හමුදාව හරහා ධාර්මික යුගය බිහිකිරීමට අවශ්‍ය රාජ්‍යතාන්ත්‍රික, ආර්ථික, සංස්කෘතික සහ අධ්‍යාපනික වටපිටාව සකස් කිරීම සඳහා නීති පැනවීමේදී ද, උපදෙස් දීමේ දී ද, විධිවිධාන ලබා දීමේ දී ද, රාජ සභාව විසින් මෙම මූලධර්ම ගුරු කොට ගන්නේ ය.

2. මෙම මූලධර්ම සඳහා පදනම් වන්නේ හෙළ හමුදාව විෂය නිර්දේශය තුළ අඩංගු වන අධ්‍යාපනය වන අතර ඒ අනුව හෙළ හමුදාවේ අරමුණ තුළ සඳහන් ධාර්මික යුගය ලෙස අදහස් වන්නේ අතීතයේ මෙන් ස්වභාවික, සාමූහික, ආධ්‍යාත්මික, සශ්‍රීක, නීරෝගී, ශක්තිමත් සහ විවේකී හෙළ ජීවන රටාව සහිත යුගයක් වන්නේ ය.

3. මතු දැක්වෙන අරමුණු ද ඇතුළත්ව ධාර්මික යුගය බිහිකිරීමට අවශ්‍ය රාජ්‍යතාන්ත්‍රික, ආර්ථික, සංස්කෘතික සහ අධ්‍යාපනික වටපිටාව හෙළ හමුදාව තුළත් ඉන් පරිබාහිරවත් ඇති කිරීමට හෙළ හමුදාව ඇප කැප වී ඇත්තේ ය.

    i. ධාර්මික යුගයට අවශ්‍ය ආධ්‍යාත්මික සහ බාහිර මට්ටමට එකවර පුද්ගලයෙකුට ළඟා වීමට නොහැකි බැවින් හෙළ හමුදාව විෂය නිර්දේශය හරහා සියලු සාමාජිකයින්ව සහ අනෙකුත් පුද්ගලයින්ව අනුක්‍රමණයෙන් ධාර්මික යුගයට අවශ්‍ය ආධ්‍යාත්මික සහ බාහිර මට්ටමට ගෙන ඒම සඳහා එදිනෙදා මානසික පීඩනයෙන් මිදීම ආදී ආධ්‍යාත්මික කරුණු සහ අධ්‍යාපනික, ආර්ථික ආදී බාහිර කටයුතු දියුණු කරගැනීමට අවශ්‍ය කරුණු පිළිබඳ මූලික දේශන සහ වැඩමුළු දියත් කිරීම.

    ii. එකී තම තමන්ගේ එදිනෙදා ආධ්‍යාත්මික සහ බාහිර දියුණුව සඳහා අවශ්‍ය මට්ටම සකස් කරගනිමින් ඊට සමගාමීව ලෝකය තුළ පවතින රාජ්‍යතාන්ත්‍රික, ආර්ථික, සංස්කෘතිය සහ අධ්‍යාපනික ආදී සියලු ක්ෂේත්‍රයන් වල ගැටළු සහ එම ගැටළු නිරාකරණයට අවශ්‍ය නිවැරදි ධාර්මික ජීවන රටාව පිළිබඳව දැනගැනීමට අවශ්‍ය මූලික දේශන සහ වැඩමුළු දියත් කිරීම.

    iii. ගැළපෙන පාර්ශවයන් සමග සම්බන්ධ වී හෙළ හමුදාවේ සහ සෙසු මිනිසුන්ගේ ජීවන තත්වයට ආධ්‍යාත්මික, ආර්ථික, සෞඛ්‍යමය ආදී ක්ෂේත්‍ර වලින් ශක්තියක් වීම සඳහා වස විසෙන් තොර ස්වභාවික කුඹුරු ගොවිතැන්, ගෙවතු වගා, ස්වභාවිකත්වයට නැඹුරු වෙදමැදුරු, ස්වාභාවික අමුද්‍රව්‍ය වලින් කරන කර්මාන්ත වැනි හෙළ හමුදාවේ අරමුණට ගැළපෙන ව්‍යාපෘති දියත් කිරීම.

    iv. ඒ ඇසුරෙන් සම්බන්ධීකරණය වන පුද්ගලයින් ඇසුරෙන් දක්ෂ හෙළ හමුදාවේ සාමාජිකයින් නිර්මාණය කිරීම සහ පරිබාහිරව දායක වීමට කැමති පුද්ගලයින්ව අනුශාසකයින්, උපදේශකයින් සහ සම්පත්දායකයින් ලෙස සම්බන්ධ කරගැනීම.

    v. ඒ ඇසුරෙන් ධාර්මික, සාමූහික, විනයවත්, ශක්තිමත් අරමුණ සහිත ප්‍රබල අභිමානවත් හෙළ හමුදාවක් නිර්මාණය කරගැනීම සහ එම එකමුතු, විනයවත් පිරිස මෙහෙයවමින් සධාරණ සාමූහික ආර්ථික ක්‍රියාවලීන් සහ දැනුවත් කිරීම් ආදිය මඟින් අරමුණ බලගැන්වීම.

    vi. රටේ බොහෝ පුද්ගලයින් විෂම ආශාවන් සහ විකෘති වුවමනාවන් වලට ඇබ්බැහි වී ඇති බැවින් එම වැරදි වල දෝෂය සහ එවායෙන් මිදීමෙන් ලැබෙන ආශ්චර්යමත් ජීවිතය පැහැදිලිව වෙන්කර තේරුම් ගැනීමට හැකි වන පරිදි, පොදු සමාජයේ කරන ව්‍යාපෘති වලට සමගාමීව ම සමාජයෙන් වෙන්ව වාසය කළ හැකි රාජ සභාව විසින් අනුමත කරන පුද්ගලයින් පදිංචි කරවා ස්වයංපෝෂිත හෙළ ආධ්‍යාත්මික ගම්මානයක් නිර්මාණය කරගැනීම.

    vii. ඒ ගම්මානය ඇසුරෙන් ඉදිරියේදී පැමිණෙන ආර්ථික කඩාවැටීම්, ස්වභාවික ආපදා ආදියට ඉතා පහසුවෙන් මුහුණ දෙන ආකාරයත්, නීරෝගී පෝෂ්‍යදායී ආහාර ආදියෙන් ලැබෙන ප්‍රබල කායික මානසික ශක්තියත්, සාමූහිකත්වයේ බලයත්, අතීත තාක්ෂණයන් වල ගැඹුරත් ආදිය සමාජයට පෙන්නුම් කිරීම.

viii. ඒ ඇසුරෙන් හෙළ හමුදාවේ අභිමානය ලෝකයට ම විදහා දැක්වීම සහ පොදු ජනතාවගේ ආකල්පය එවන් ජීවන රටාවකට අවශ්‍ය මට්ටමට ගෙන ඒම සඳහා තවදුරටත් රට තුළ ව්‍යාපෘති දියත් කිරීම.

ix. අපගේ සියලු ඉගැන්වීම්, දේශන සහ ව්‍යාපෘති ආදිය විවිධ භාෂා වලට පරිවර්තනය කරමින් විදේශ රටවල් තුළ සිටින ධාර්මික ජීවන රටාවට කැමති පුද්ගලයින් සම්බන්ධීකරණය කරගැනීම සහ ඔවුන්ට අවශ්‍ය දැනුම, සහයෝගය සහ දිරිමත් කිරීම සිදුකිරීම.

x. ඒ ඇසුරෙන් වත්මන් නොදැනුවත් මිනිසුන්ට නොපෙනෙන ඉදිරියට පැමිණෙන දැවැන්ත ගෝලීය ව්‍යසනයට මුහුණ දී ඉන්පසු බිහිවන ධාර්මික යුගයට අවශ්‍ය වටපිටාවේ මූල බීජ ලෝකය පුරා ම තැන්පත් කිරීම.

4. හෙළ හමුදාව සෑම විටම හෙළ හමුදාවේ සාමාජිකයින් ද, ඔවුන්ගේ පවුල් වල හෝ සමීපතම අය ද, හෙළ හමුදාවට සහයෝගය දෙමින් හෙළ හමුදාවේ ප්‍රතිලාභ ලබමින් විශ්වාසවන්ත සම්බන්ධතාවය පවත්වනු ලබන අය ද, ඔවුන්ගේ පවුල් වල අය හෝ සමීපතමයන් ද, ඉදිරියට ඇතිවෙන ආර්ථික ආදී අර්බුද හමුවේ ආරක්ෂා කරනු ලබන්නේ ය.

5. විශේෂයෙන් ම ඉහළ ආධ්‍යාත්මික ගුණ වගාවක් ඇති බවට රාජ සභාව විසින් පිළිගනු ලබන ඕනෑ ම අයෙක්ට සහ හෙළ හමුදාවට අවංකව, පක්ෂපාතීව, හෙළ හමුදාවේ නීතිරීති සහ ප්‍රතිපත්ති වලට අනුකූලව කටයුතු කරන බවට රාජ සභාව විසින් පිළිගනු ලබන විශේෂ සාමාජිකයින් අතුළු සාමාජිකයින්ට ප්‍රමුඛතාවය ලැබෙන්නේ ය.

6. හෙළ හමුදාව නොසළකා හැරි හෝ හෙළ හමුදාවට ද්‍රෝහී වූ හෝ බාධා පැමිණවූ හෝ හෙළ හමුදාව සමඟ සම්බන්ධ කරගැනීමෙන් හෙළ හමුදාවේ ආරක්ෂාවත්, අරමුණත් අවදානමේ හෙළන මට්ටමේ අධාර්මික ගති පැවතුම් ඇති හෝ පුද්ගලයින් ලෙස රාජ සභාව විසින් තක්සේරු කරනු ලබන පුද්ගලයින්ව හෙළ හමුදාව විසින් නොසළකා හැරීමට හෝ දැඩි කොන්දේසි යටතේ ආරක්ෂා කිරීමට ඉඩ ඇත්තේ ය.

## හෙළ හමුදාවේ ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූලධර්ම විනිශ්චය කළ හැකි ආකාරය

40

1. ඉහත 'හෙළ හමුදාවේ ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූලධර්ම' රාජධර්මයේ විධිවිධාන හේතුකොටගෙන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අධිකරණ ක්‍රියාවලිය ඔස්සේ දිනා ගත හැකි කිසිඳු අයිතිවාසිකමක් කිසිවෙකුට නොපැවරෙන්නේ ය. නීතියෙන් කිසිඳු බැඳීමක් ඇති නොවන්නේ ය. තව ද මේ පරිච්ඡේදයේ විධිවිධාන ජනරජයේ අධිකරණයක් හෝ විනිශ්චයකාර අධිකාරයක් විසින් ක්‍රියාත්මක කරවාගත නොහැක්කේ ය. එම විධිවිධානවලට අනුකූල නොවීම පිළිබඳව ප්‍රශ්නයක් ජනරජයේ කවර වූ අධිකරණයකට හෝ විනිශ්චයකාර අධිකාරයකට ඉදිරිපත් කළ නොහැක්කේ ය.

2. එසේ වුව ද ඉහත එම 'හෙළ හමුදාවේ ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූලධර්ම' රාජ ධර්මයේ විධිවිධාන හෙළ හමුදාව තුළ ක්‍රියාත්මක නොවීම පිළිබඳ රාජ සභාවට පැමිණිලි කිරීම සිදුකළ හැක්කේ ය. එසේ පැමිණිලි කර හෙළ හමුදාවෙන් ඵල ප්‍රයෝජන ලැබිය හැකි සියලු දෙනාගේ හිත සුව පිණිස එම විධිවිධාන ක්‍රියාත්මක කරවා ගැනීම සාමාජිකයෙකුගේ හෝ බාහිර ඕනෑ ම කෙනෙකුගේ වගකීමක් වන්නේ ය.

## සාමාජිකයින්ගේ මූලික වගකීම්

41 හෙළ හමුදාවේ අරමුණු සාක්ෂාත් වීමත්, එයින් ඵල ප්‍රයෝජන ලබන්නන් එය භුක්ති විඳීමත් යන කරුණු හෙළ හමුදාවේ ඉගැන්වීම්, ප්‍රතිපත්ති සහ නීති රීති තුළ ක්‍රියාත්මක වීමෙන් වෙන්ව පැවතිය නොහැක්කේ ය. එබැවින්,

1. හෙළ හමුදාවේ අධ්‍යාපනය හොඳින් ප්‍රගුණ කර ඉහළ ආධ්‍යාත්මික දියුණුවක් සකස් කරගැනීම ද,

2. හෙළ හමුදාවේ අරමුණ තමන් තුළ ප්‍රබලව වර්ධනය කිරීම ද,

3. හෙළ හමුදාවේ රාජ ධර්මය, ප්‍රතිපත්ති සහ නීතිය ආරක්ෂා කොට දැඩිව අනුගමනය කිරීම ද,

4. හෙළ හමුදාවේ ගුණයන් ඇසුරෙන් ගොඩනැගෙන්නා වූ සත්‍ය අභිමානය ආරක්ෂා කරගැනීම ද,

5. හෙළ හමුදාවේ අභිවෘද්ධිය වර්ධනය කිරීම හා හෙළ හමුදාවේ සමගිය පෝෂණය කිරීම ද,

6. හෙළ හමුදාවේ අනෙකුත් පුද්ගලයින් ආරක්ෂිත සහ ධෛර්යමත් කිරීම ද,

7. හෙළ හමුදාවේ තමන් විසින් තෝරාගනු ලැබූ වගකීම හෘදසාක්ෂියට එකඟව නොපිරිහෙලා ඉටුකිරීම ද,

8. හෙළ හමුදාවේ ගෞරවය සහ ප්‍රධානීන්ගේ ගෞරවය ආරක්ෂා වන පරිදි කටයුතු කිරීම ද,

9. හෙළ හමුදාවේ දේපළ අයථා පරිදි ප්‍රයෝජනයට ගැනීමට සහ නාස්ති කිරීමට එරෙහිව ක්‍රියා කිරීම ද,

10. හෙළ හමුදාවේ අනෙකුත් පුද්ගලයිනගේ අයිතිවාසිකම් සහ නන්වැදෑරුම් නිදහසට ගරු කිරීම ද,
හෙළ හමුදාවේ සාමාජිකයින්ගේ මූලික වගකීම් වන්නේ ය.

## මූලික වගකීම් විනිශ්චය කළ හැකි ආකාරය

42

1. ඉහත රාජධර්මයේ විධිවිධාන වලින් හෙළ හමුදාවේ කිසිඳු සාමාජිකයෙක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අධිකරණ ක්‍රියාවලිය ඔස්සේ දිනා ගත හැකි කිසිඳු වගකීමකට හෙළ හමුදාව සමඟ නොබැඳෙන්නේ ය, නීතියෙන් කිසිඳු බැඳීමක් ඇති නොවන්නේ ය, ජනරජයේ අධිකරණයක් හෝ විනිශ්චයකාර අධිකාරයක් විසින් ක්‍රියාත්මක කරවා ගත නොහැක්කේ ය, එම විධිවිධානවලට අනුකූල නොවීම පිළිබඳව ප්‍රශ්නයක් ජනරජයේ කවර වූ අධිකරණයකට හෝ විනිශ්චයකාර අධිකාරයකට ඉදිරිපත් කළ නොහැක්කේ ය.

2. එසේ වුව ද 'සාමාජිකයින්ගේ මූලික වගකීම්' රාජ ධර්මයේ විධිවිධාන හෙළ හමුදාව තුළ ක්‍රියාත්මක නොවීම පිළිබඳව රාජ සභාවට හෙළ හමුදාවේ සාමාජිකයින් විනිශ්චයට භාජනය කළ හැක්කේ ය, ඊට පටහැනිව ක්‍රියාත්මක වන සාමාජිකයින්ට රාජ සභාවෙන් අනුමත ක්‍රියා පටිපාටියට අනුව දඬුවම් පැනවිය හැක්කේ ය.

### හෙළ හමුදාවේ ප්‍රධානියා

43

1. හෙළ හමුදාවේ ප්‍රධානියා හෙළ හමුදාවේ නායකයා වන්නේ ය. ප්‍රධානියා හෙළ හමුදාවේ ව්‍යවස්ථාදායකයේ, විධායකයේ සහ අධිකරණයේ ප්‍රධානියා මෙන් ම ආරක්ෂක අංශයෙහි අංශ ප්‍රධානියා ද වන්නේ ය.

2. හෙළ හමුදාවේ ප්‍රධානියා තමාගේ පරමාධිපත්‍යය අනුව ක්‍රියාත්මක වන්නේ ය.

3. හෙළ හමුදාවේ ප්‍රධානියා හෙළ හමුදාවේ සාමාජිකයෙක් නොවන්නේ ය. සාමාජිකයින් විසින් තෝරාපත් කරගන්නෙක් ද නොවන්නේ ය. සාමාජිකයින් විසින් ඉවත් කිරීම ද කළ නොහැක්කේ ය.

4. හෙළ හමුදාවේ ප්‍රධානියා 'රාජා භවතු ධම්මිකො' හෙවත් 'රජු දැහැමි වේවා' යන තේමාව යටතේ පාලනය සිදුකරනු ලබන්නේ ය.

### ප්‍රධානියාගේ අසුන හිස් වීම

44

1. ප්‍රධානියා මිය ගියහොත් පමණක් හෙළ හමුදාවේ ප්‍රධානී ධුරය හිස් වන්නේ ය.

2. එසේ හිස් වීමක් සිදු වුවහොත් හෙළ හමුදාවට තවදුරටත් පැවැත්මක් නැත්තේ ය.

### රාජ සභාව

45

1. අරමුණ සහ විනය බලගැන්වී හෙළ හමුදාවේ ප්‍රධානියා සමඟ විශ්වසනීය බව ඇති වීමෙන් ප්‍රධානියා විසින් තෝරා පත්කරගනු ලබන නායකයින්ගෙන් සමන්විත රාජ සභාවක් වන්නේ ය.

2. 'සමග්ගා හොථ මා විවදථ' හෙවත් 'සමගි වෙව විවාද නොකරව' යන තේමාව යටතේ රාජ සභාව ක්‍රියාත්මක වන්නේ ය.

3. රාජ සභාව ව්‍යවස්ථාදායකය ලෙස නීති සම්පාදනය කිරීම ද, විධායකය ලෙස නීති ක්‍රියාත්මක කිරීම ද, අධිකරණය ලෙස යුක්තිය පසිඳලීම ද සිදු කරන්නේ ය.

4. රාජ සභාවේ කටයුතු සඳහා ප්‍රධානියාට සහයෝගය දීමට ප්‍රධානියා විසින් සුදුසුකම් උපරිමයෙන් ඇති රාජ සභාවෙන් තෝරා පත් කරනු ලබන උප නායකයා 'උප ප්‍රධානියා' නම් වන්නේ ය.

5. අංශ ප්‍රධානීන්ගේ සහ රාජ සභාවේ වැඩකටයුතු සම්බන්ධීකරණය සහ අධීක්ෂණය කිරීම ඇතුළු ප්‍රධානියා විසින් පවරන ලද යම් කාර්යයන් සිදු කිරීම උප ප්‍රධානියාගේ කාර්යභාරය වන්නේ ය.

6. රාජ සභාව විසින් හෙළ හමුදාවේ අංශ සංඛ්‍යාව ද, ඒ අංශ වලට පවරන විෂය සහ කාර්යය ද තීරණය කරනු ලබන්නේ ය.

7. රාජ සභාව විසින් එසේ තීරණය කරනු ලබන අංශ බාරව කටයුතු කිරීම සඳහා අංශ නායකයින් ලෙස රාජ සභාවේ නියෝජිතයින් අතරින් 'අංශ ප්‍රධානීන්' සහ අංශ ප්‍රධානීන්ගේ කාර්යය ඉටු කිරීමෙහි ලා සහය දීම පිණිස රාජ සභාවේ නියෝජිතයන් අතරින් 'අංශ උප ප්‍රධානීන්' පත් කරනු ලබන්නේ ය.

8. රාජ සභාවේ කවර හෝ අංශ ප්‍රධානියෙකු විසින් ඔහු වෙත පැවරී ඇති බලතල හෝ කාර්යයන් වලින් කොටසක් රාජ සභාව දැනුවත් කිරීමෙන් පසු අංශ උප ප්‍රධානියාට පවරා දිය හැක්කේ ය.

9. රාජ සභාවට ප්‍රධානියා විසින් පත් කරනු ලබන ලේකම්වරයා 'මහ ලේකම්' හෙවත් 'ලේඛන අංශ ප්‍රධානියා' වන්නේ ය. රාජ සභාවේ කටයුතු වාර්තා කිරීමත් සෙසු සියලුම අංශ වල ලේකම්වරුන් සමඟ සම්බන්ධ වී ලේඛන කටයුතු සම්බන්ධීකරණය කිරීමත් රාජ සභාවේ මහ ලේකම්වරයා විසින් ඉටු කළ යුත්තේ ය.

10. මහ ලේකම්වරයාගේ කාර්යය ඉටු කිරීමෙහි ලා සහය දීම පිණිස රාජ සභාවේ නියෝජිතයන් අතරින් 'උප ලේකම්' වරයෙක් පත් කරනු ලබන්නේ ය.

11. එසේ ම යම් කටයුතුවල වගකීම් දැරීමට වෙනත් තනතුරු රාජ සභාව තුළ නියෝජනය කළ යුතු බවට රාජ සභාව විසින් තීරණය කරනු ලබන විට එම තනතුරු සඳහා ඇතැම් සාමාජිකයින් රාජ සභාවට ඇතුළත් කරනු ලබන්නේ ය.

12. ප්‍රධානියා විසින් කවර අවස්ථාවකදී වුවද නායකයින්ට පවරන ලද විෂය සහ කාර්යය වෙනස් කරනු ලැබීමට සහ රාජ සභාවේ සංයුතිය වෙනස් කරනු ලැබීමට හැක්කේ ය.

13. ඕනෑ ම අවස්ථාවක යම් අංශයක නායකයෙකුට තම විෂය සහ කාර්යය මාරු කර ගැනීමට රාජ සභාවට යෝජනා කළ හැකි අතර රාජ සභාව විසින් එය තීරණය කරනු ලබන්නේ ය.

14. රාජ සභාවට පත් කරනු ලබන සෑම නායකයෙක් ම රාජ සභාවට ද, රාජ සභාව ප්‍රධානියාට ද වගවීමට සහ වගකීමට බැඳී සිටින්නේ ය.

15. ඒ අනුව ප්‍රධානියා, උප ප්‍රධානියා, අංශ ප්‍රධානීන්, අංශ උප ප්‍රධානීන්, සහ අනෙකුත් තනතුරු සඳහා අනුමත සාමාජිකයින්ගෙන් රාජ සභාව සමන්විත වන්නේ ය.

16. රාජ සභා නායකයින් සියලු දෙනා රාජ සභාවේ නියෝගය පරිදි හෝ ස්වකැමැත්තෙන් රාජ සභාව වෙත කරනු ලබන ඉල්ලීමක් මගින් ධූරයෙන් ඉල්ලා අස් වුවහොත් හෝ රාජ සභාව විසුරුවා හැරියහොත් මිස යම් තාක් කල් රාජ සභාව පවතින්නේ ද ඒ තාක් කල් ස්වකීය ධූරය තුළ අඛණ්ඩව වලංගු වන්නේ ය.

## රාජ සභාවේ අසුන් හිස් වීම

46 රාජ සභාවේ,

1. නායකයෙකු රාජ සභාව විසින් ඉවත් කළහොත් හෝ,

2. නායකයෙකු මිය ගියහොත් හෝ,

3. නායකයෙකු රාජ සභාව වෙත දන්වා තම අසුනෙන් ඉල්ලා අස්වීමෙන් හෝ,

4. නායකයෙකුගේ නීති රීති පද්ධතියේ සඳහන් යම් ආකාරයකින් නුසුදුස්සෙක් වීමෙන් හෝ,

   රාජ සභාවේ නායකයෙකුගේ අසුන හිස් වන්නේ ය.

## රාජ සභාවේ කාර්යය පටිපාටිය සහ බලතල

47

1. රාජ සභාවේ ප්‍රධානියා හැර අනෙකුත් කුමන නායකත්ව ධූරයක් හෝ කීපයක් හෝ සියල්ලම හෝ හිස්ව තිබුණ ද රාජ සභාවේ ක්‍රියා කිරීමට ප්‍රධානියාට බලය ඇත්තේ ය.

2. ප්‍රධානියා නොමැතිව හෝ ප්‍රධානියා විසින් දෙන ලද නියෝගයක් නොමැතිව, උප ප්‍රධානියාට හෝ අංශ ප්‍රධානීන්ට රාජ සභාව රැස්කර සාකච්ඡා කළ හැකි නමුත් කිසිඳු ව්‍යවස්ථාදායක, විධායක හෝ අධිකරණ බලයක් නැත්තේ ය.

3. සෑම රාජ සභා රැස්වීමකදීම රැස්වීමට පෙර උප ප්‍රධානියා විසින් මහ ලේකම් හරහා සියලු සභිකයින් රාජ සභාවේ නියෝජනය කිරීමට අනුමැතිය ලත් අය ද යන්න පරික්ෂා කළ යුත්තේ ය.

4. රාජ සභාව තුළ සිදුවන සාකච්ඡා සහ විශේෂ රැස්වීම් මහ ලේකම්වරයා විසින් වාර්තා කළ යුත්තේ ය.

5. ප්‍රධානියා විසින් අවශ්‍ය ඕනෑ ම විටෙක රාජ සභාව කැඳවීම හා කල් දැමීම කළ හැක්කේ ය.

6. එසේ විශේෂයෙන් කැඳවීම හෝ කල් දැමීම සිදු නොකළ අවස්ථාවකදී රාජ සභාව අවම වශයෙන් සෑම සතියකට ම වරක් ම රැස්විය යුත්තේ ය.

7. රාජ සභාවේ ඕනෑ ම නියෝජිතයෙක්ට හෙළ හමුදාවේ දියුණුව සඳහා ඕනෑ ම අදහසක්, යෝජනාවලියක් හෝ පනතක් රාජ සභාවට ඉදිරිපත් කළ හැක්කේ ය.

8. රාජ සභාවේ තීරණ ගැනෙන්නේ බහුතර එකඟතාවයෙන් නොවන අතර රාජ සභාවේ යෝජනා සෑම විටම ප්‍රධානියාගේ අනුමැතියෙන් සම්මත වීම හෝ නිශේධ වීම සිදු වන්නේ ය.

9. රාජ ධර්මයේ යම්කිසි සංශෝධනයක් කරනු ලබන්නේ නම් එය රාජ සභාව විසින් අනුමත කොට නිල වශයෙන් ප්‍රසිද්ධියේ ප්‍රකාශයට පත් කළ යුත්තේ ය.

10. යම්කිසි තත්ත්වයක් පිළිබඳව සාමාජික මත විචාරණයක් සළකා බැලිය යුතු බවට රාජ සභාව විසින් තීරණය කරනු ලැබූ අවස්ථාවකදී සාමාජික මත විචාරණයක් කරනු ලබන්නේ ය. එය අදහස් විමසීමක් පමණක් වන අතර ව්‍යවස්ථාදායක බලයක් නොමැත්තේ ය.

11. රාජ සභාව තුළ සම්පාදනය වන නීති රාජ සභාවේ විධායක බලය සහිත නායකයින් හරහා ම ක්‍රියාත්මක වන්නේ ය. එනම් විධායකය ද රාජ සභාව හරහා ක්‍රියාත්මක වන්නේ ය.

12. රාජ සභාවේ විධිවිධාන වලට යටත්ව හෙළ හමුදාවේ සහ සාමාජිකයින්ගේ ආරක්ෂාව සහ දියුණුව තහවුරු කිරීමට හෙළ හමුදාව තුළ යුක්තිය පසිඳලන ආයතනය හෙවත් අධිකරණය ද රාජසභාව ම ය. අධිකරණ බලය ඇත්තේ රාජ සභාවට සහ රාජ සභාව විසින් අනුමත කරන ලද නායකයින්ට, අනුමත කරන ලද පරිමාණයට පමණක් වන්නේ ය.

13. හෙළ හමුදාවේ නීතියක්, හෙළ හමුදාවේ යම් ඕනෑ ම විධායක හෝ පරිපාලනමය ක්‍රියාවක් මගින් හෝ කිසියම් සාමාජිකයෙකු මගින් හෝ උල්ලංඝනය කර හෝ උල්ලංඝනයට අත්‍යාසන්නව තිබීම හෝ සම්බන්ධයෙන් රාජ සභාවට විනය පරීක්ෂණයක් සඳහා පැමිණිලි කිරීමේ ක්‍රියාපටිපාටියට අනුව පැමිණිලි කිරීමට, එම උල්ලංඝනය නිසා පීඩා විඳින හෝ එම උල්ලංඝනය දකින්නා වූ හෝ හෙළ හමුදාවේ සාමාජිකයින්ට හෝ වෙනත් බාහිර පුද්ගලයෙක්ට හෝ හැක්කේ ය.

14. ඒ ආකාරයට පැමිණිල්ලක් තවත් සාමාජිකයෙක්ගෙන් හෝ සාමාජිකයෙක් නොවන පුද්ගලයෙක්ගෙන් හෝ රාජ සභාව වෙත ඉදිරිපත් වූ විට මෙන්ම රාජ සභාව විසින් ම නිරීක්ෂණය කළ විට, අදාළ චූදිතයාව රාජ සභාව විසින් තීරණය කරනු ලබන ක්‍රමයකට විනය පරීක්ෂණයකට ගෙන විනිශ්චය කරනු ලබන්නේ ය.

15. එහිදී රාජ සභාව විසින් හෝ රාජ සභාව විසින් අනුමත කරන ලද ක්‍රියාපටිපාටිය අනුව දෙන විනිශ්චය අවසන් විනිශ්චය වන්නේ ය. චූදිතයා වරදකරු ලෙස නම් කර රාජ සභාවේ අභිමතය පරිදි යම් දඬුවමක් නියම කිරීමෙන් අනතුරුව එම සාමාජිකයාට එම දඬුවමට මුහුණ දීම හෝ ඉල්ලා අස්වීම යන තීරණ දෙකෙන් එකක් තෝරාගැනීමට සම්පූර්ණ නිදහස ඇත්තේ ය.

අටවන පරිච්ඡේදය - උපලේඛනය

## උපලේඛනයේ අන්තර්ගතය

48 හෙළ හමුදාවේ අංශ වල කටයුතු සහ සෙසු කටයුතු සඳහා අවස්ථානෝචිතව නිතර සංශෝධනය වීමට ඉඩ ඇති නීති රීති සහ ක්‍රියාපටිපාටීන් මෙන් ම හෙළ හමුදාවේ නිල ලාංඡනය වැනි අනෙකුත් තොරතුරු උපලේඛනය තුළ අන්තර්ගත වන්නේ ය.

**හෙළ හමුදාව රාජ ධර්මය නිමි.**

**බුද්ධොහං බොධයිස්සාමි - මුත්තොහං මොචයෙ පරෙ**

**තිණ්ණොහං තාරයිස්සාමි - සංසාරොඝා මහබ්භයා**

**හෙළයට ජය!**